IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2018/2019

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2021 මාර්තු)

## BLE 204 - කාර්මික සම්බන්ධතා

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. (I කොටසේ ප්‍රශ්න හතරක් (04) හා II කොටසේ ප්‍රශ්න හතරක් (04) ඇත.)

(2) **I කොටසේ පළමු ප්‍රශ්නය (01) අනිවාර්ය** වන අතර තවත් ප්‍රශ්න දෙකකට (02) පිළිතුරු සැපයිය යුතුය.

(3) **II කොටසේ පළමු ප්‍රශ්නය (01) ප්‍රශ්නය අනිවාර්ය** වන අතර තවත් ප්‍රශ්න දෙකකට (02) පිළිතුරු සැපයිය යුතුය.

(4) පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන හයකි. (06)

(5) **I කොටස හා II කොටස සඳහා වෙන වෙනම පිළිතුරු පොත් භාවිතා කළ යුතුය.**

(6) කාලය පැය තුනයි. (03)

(7) අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.

(8) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(9) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

## I කොටස

**01.** 'සේවකයින්හට සෞඛ්‍ය සම්පන්න සහ ආරක්ෂිත පරිසරයක් ලබාදීමට ආයතන බැඳී සිටී. සේවා පරිසරයේ භෞතික හා සමාජ මනෝවිද්‍යාත්මක අංශ දෙකම වෘත්තීය සෞඛ්‍යයට සහ ආරක්ෂාවට බලපෑම් කරයි. වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරණ ප්‍රයත්නය තුල උපද්‍රවකාරී වැඩ පරිසරය ඉවත්කිරීමේ උපාය මාර්ගද අන්තර්ගත විය යුතුය.'

- **i.** ඔබ, කොවිඩ් - 19 වසංගතය සමඟ මෑතකදී මුහුණ දුන් අත්දැකීම මත පදනම්ව ඉහත ප්‍රකාශය පහදන්න.

**(ලකුණු 10)**

- **ii.** මෙම කොවිඩ් - 19 වසංගත තත්වය සමඟ පැනනගින සේවක සෞඛ්‍ය හා ආරක්ෂක ගැටළු සඳහා පිළියම් ඇතුලත් කෙටි වැඩසටහනක් නිර්මාණය කිරීමේ වගකීම ඔබට පැවරී ඇතැයි සිතන්න. ඔබ ක්‍රියාකරන අයුරු කෙටියෙන් පහදන්න.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**02.**

- **i.** 'සේවකයින් සේවයේ මාරුකිරීම සේවායෝජකයාගේ අයිතියක් වුවද, එය සීමාවන්ට යටත්වේ.' මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවේද? පහදන්න.

**(ලකුණු 10)**

- **ii.** සේවක උසස්වීම් ලබාදීම සඳහා යොදාගත හැකි නිර්ණායක කවරේද? ඉන් එක් (01) නිර්ණායකයක් කෙටියෙන් පහදන්න.

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 15)**

**03.**

- **i.** නුවන් මහතා රසායනික ද්‍රව්‍ය ආයතනයක යාන්ත්‍රික ශිල්පියෙකි. දිනක් ඔහු නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ ඔහුගේ සුපරීක්ෂක සමඟ කුපිත වී සුපරීක්ෂකට මහා හඬින් නින්දා සහගත ලෙස බැන වැදුණේය. නුවන් මහතාගේ මෙම හැසිරීම අසාමාන්‍ය දෙයක් විය. නුවන් සඳහා ඔබ නිරවද්‍ය විනය හෝ වළක්වාලීමේ විනය හෝ එම දෙකම හෝ නිර්දේශ කරන්නෙහිද? පහදන්න.

**(ලකුණු 10)**

- **ii.** 'විනය වැරදි මූලික වශයෙන් දෙවර්ගයකි' විස්තර කරන්න.

**(ලකුණු 05)**

**(මුළු ලකුණු 15)**

04.

i. ඔබ ආයතනයක දෙපාර්තමේන්තු ප්‍රධානියකු යයි සිතන්න. ඔබේ දෙපාර්තමේන්තුවේ දුක්ගැනවිල්ලකට ලක්වූ සේවාදායකයෙකු තුල ජනිත වූ මානසික පීඩනය ඉවත් කිරීම පිණිස ඔබ උපක්‍රමික වශයෙන් යොදාගනු ලබන ක්‍රියාමාර්ග කවරේද? පහදන්න.

(ලකුණු 10)

ii. ශ්‍රමික සම්බන්ධතාවලට සම්බන්ධිත ප්‍රධාන පාර්ශව කවරේද? මෙම පාර්ශව අතර අන්තර් රුදියාව කෙටියෙන් පහදන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 15)

## II කොටස

01. සේව්‍ය-සේවක සබඳතාවය තුළ වැඩ වර්ජනය කිරීමට ඇති අයිතිය ප්‍රබල අයිතිවාසිකමක් ලෙස කම්කරු නීතිය මඟින් පිළිගනී. ශ්‍රී ලංකා නීතිය තුළ වැඩ වර්ජනයේ අයිතිය පිළිගෙන ඇති ආකාරය විමර්ශනය කරමින් එම අයිතිය භුක්ති විඳීමට ඇති සීමාවන් අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

02. කාර්මික ආරවුලක් යන්න විස්තර කොට කාර්මික ආරවුලක් විසඳා ගැනීමට පවතින ක්‍රමවේද කවරේදැයි විස්තර කරන්න. ඒ එක් එක් ක්‍රමවේදයන්හි පවතින උපයෝගීතාවය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 15)

03. කාර්මික සුබ සාධනය උදෙසා ශ්‍රී ලංකාවේ පවතින නීතිමය තත්ත්වය, අවම වශයෙන් අදාල ව්‍යවස්ථාවන් 03 ක් ඇසුරෙන් විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 15)

04. කාර්මික සබඳතා ක්ෂේත්‍රය තුළ සේවා යෝජක සේවක සම්බන්ධතාවයන් කළමනාකරණය කෙරෙහි වෘත්තීය සමිති වල දායකත්වය විවේචනාත්මකව විමසන්න. අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මඟින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 15)

*********************************************************************